# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2348/48 - 2023 සැප්තැම්බර් මස 08 වැනි සිකුරාදා - 2023.09.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනත**

4 වැනි වගන්තිය යටතේ නියෝගය

1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව, විදේශ කටයුතු අමාත්‍ය එම්. යූ. එම්. අලි සබ්රි වන මම, 2022 සැප්තැම්බර් 14 වැනි දින අත්සන් තබන ලද ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) අතර පවතින සත්කාරක රාජ්‍ය පිළිබඳ ගිවිසුමේ IV, V, VI, IX, X, XI, XII, XIII, XIV, XV සහ XVI යන වගන්තිවල නියමයන් බලාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණයට, ඉහත සඳහන් පනතේ විධිවිධාන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) අතර පවතින සත්කාරක රාජ්‍ය ගිවිසුම සම්බන්ධයෙන් අදාළ වන බව නියෝග කොට ප්‍රකාශ කරන අතර, එම ගිවිසුමේ අදාළ වගන්ති මෙහි උපලේඛනයෙන් කියවනු ලැබේ.

**එම්. යූ. එම්. අලි සබ්රි,** (ජා.නි.පා.ම.)
විදේශ කටයුතු අමාත්‍ය.

2023 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

1A - PG 6481— 256 (2023/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) අතර සත්කාරක රාජ්‍ය ගිවිසුම**

IV වැනි වගන්තිය

මධ්‍යස්ථානය සම්බන්ධයෙන් රජයේ වගකීම්

1. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය, එහි වත්කම්, ආදායම් සහ අනෙකුත් දේපළ සියලු සෘජු බදුවලින් නිදහස් කළ යුතු ය.

2. රේගුව හරහා නිෂ්කාශනය කිරීමට පෙර එම භාණ්ඩ මිලදී ගැනීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සිදුකරන්නේ නම්, කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය විසින් සිය නිල භාවිතය සඳහා ආනයනය කරන ලද හෝ අපනයනය කරන ලද සියලුම ද්‍රව්‍ය, උපකරණ, ලිපි, වාහන, යන්ත්‍රෝපකරණ, ප්‍රකාශන සහ සැපයුම් සඳහා රේගු බදු, එකතු කළ අගය මත බද්ද (VAT) සහ වෙනත් බදු හෝ මූල්‍ය ගාස්තුවලින් නිදහස් කළ යුතුය. තීරුබදු සහ බදු රහිතව ආනයනය කරන ලද එවැනි භාණ්ඩ සුදුසු තීරුබදු සහ බදු ගෙවන්නේ නම් හෝ එම භාණ්ඩ විකුණා හෝ ඒ හා සමාන වරප්‍රසාද ලත් පුද්ගලයන්ට හෝ සංවිධානවලට හෝ ප්‍රතිඅපනයනය කරන්නේ නම් මිස, රට තුළදී මාරු කිරීම හෝ බැහැර කිරීම නොකළ යුතු ය.

3. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය එහි නිල භාවිතය සඳහා ගිවිසුම්ගත හෝ දේශීයව මිල දී ගන්නා ද්‍රව්‍ය සහ උපකරණ සඳහා වූ බදුවලින් නිදහස් කෙරේ.

V වැනි වගන්තිය

මධ්‍යස්ථානයේ විද්‍යාත්මක හා පරිපාලන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් රජයේ වගකීම්

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල සංසන්දනාත්මක තරාතිරමේ කාර්ය මණ්ඩලයට ප්‍රදානය කොට ඇති ඒවාට වඩා අඩු වාසිදායක තත්ත්වයක් නොවන වරප්‍රසාද සහ මුක්තිය කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ තාක්ෂණික සහ පරිපාලන කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ යැපෙන්නන් සඳහා රජය විසින් ප්‍රදානය කළ යුතුය. ඉහත සඳහන් කරුණුවලට සීමා නොවී, රජය විසින් පහත කරුණු සිදුකරනු ලැබේ:

   අ. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වෙතින් ඔවුන්ට ලැබෙන ආදායම හෝ වැටුප් සඳහා වූ ආදායම් බදු හෝ සමාජ ආරක්ෂණ දායකත්වයෙන් නිදහස් කිරීම;

   ආ. ඔවුන් මෙරටට පැමිණි පළමු මාස හය ඇතුළත දී හෝ රජය විසින් අනුමත කළ හැකි එවැනි වෙනත් කාලසීමාවක් තුළදී ඔවුන් විසින් ආනයනය කරන ලද ඔවුන්ගේ අලුත් හෝ භාවිත කළ පෞද්ගලික සහ ගෘහස්ථ භාණ්ඩ සහ මෝටර් රථ සඳහා රේගු බදු, විකුණුම් බද්ද සහ එකතු කළ අගය මත බද්ද (වැට්) ගෙවීමෙන් ඔවුන් නිදහස් කරනු ලබන අතර, තීරුබදු, බදු රහිතව ආනයනය කරන ලද එවැනි පෞද්ගලික සහ ගෘහස්ථ භාණ්ඩ සුදුසු තීරුබදු, බදු ගෙවන්නේ නම් හෝ සමාන වරප්‍රසාද ලත් පුද්ගලයන්ට හෝ සංවිධානවලට මාරු කිරීම, විකිණීම හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රොටෝකෝල මාර්ගෝපදේශයන්ට යටත් ව ප්‍රතිඅපනයනය කරනු ලබන්නේ නම් මිස, රට තුළ දී මාරු කිරීම හෝ විකිණීම නොකළ යුතු ය;

   ඇ. ජාතික සේවා වගකීම්, විදේශික ලියාපදිංචිය සහ සංක්‍රමණ සීමා කිරීම්වලින් ඔවුන් සහ ඔවුන්ගේ යැපෙන්නන් නිදහස් කිරීම සහ ඔවුන් ට සහ ඔවුන්ගේ යැපෙන්නන් ට කිසිදු අයකිරීමකින් තොරව නැවත ඇතුල්වීමේ බලපත්‍ර ලබාදීම සහ ඒවා පසුව අලුත් කිරීම;

   ඈ. රජය විසින් අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල කාර්ය මණ්ඩලය වෙත ලබා දෙන පරිදි ජාත්‍යන්තර අර්බුදකාරී අවස්ථාවන්හි දී ඔවුන් ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන් වෙත සියරට ආපසු ළඟා වීමේ පහසුකම් ලබාදීම;

   ඉ. ඔවුන් ට හෝ ඔවුන්ගේ යැපෙන්නන් ට පෞද්ගලික පරිහරණය සඳහා සාධාරණ විදේශ මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ට ගෙන ඒමට සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවලට අදාළ වන පරිදි පවතින

තත්ත්වය ට අනුව එම මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ විනිමය රෙගුලාසිවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සිට බාහිර ගිණුම් පහසුකම් යටතේ ආපසු ගෙන යාමට අවසර දීම;

ඊ. මධ්‍යස්ථානයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සංචාර ගමනාගමනයන් සහ සන්නිවේදනයේ නිදහස ඔවුන් ට ලබා දීම;

උ. ඔවුන්ගේ නව හෝ භාවිතා කරන ලද පෞද්ගලික සහ ගෘහස්ථ භාණ්ඩ රේගුව හරහා නිෂ්කාශනය කිරීමට සහ ඔවුන් ට හැඳුනුම්පත් නිකුත් කිරීම ට පහසුකම් සැලසීම;

ඌ. එවැනි පුද්ගලයන් ට (කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ තාක්ෂණික සහ පරිපාලන කාර්ය මණ්ඩලය) කතා කරන හෝ ලිඛිත වචන සහ ඔවුන්ගේ නිල හැකියාවෙන් ඔවුන් විසින් සිදු කරන ලද ක්‍රියාවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාවලියෙන් මුක්තිය ලබා දීම; අදාළ පුද්ගලයා කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය හි නිලධාරියෙකු වීම අවසාන වී තිබියදී ද එවැනි මුක්තියක් අඛණ්ඩව පවතිනු ඇත;

2. ඉහත 1 (අ), 1 (ඇ), 1 (ඉ), 1 (ඊ) සහ 1 (උ) ඡේදවල දක්වා ඇති වරප්‍රසාද සහ මුක්තිය කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය මගින් පත්කොට සිටින අනේවාසික උපදේශකයින් සහ අනෙකුත් වෘත්තිකයන්ට රජය විසින් ප්‍රධානය කළ යුතු ය.

3. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන් වන කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය ට මෙම වගන්තියේ විධිවිධාන අදාළ නොවේ.

## VI වැනි වගන්තිය

### අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ නම් කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් රජයේ වගකීම්

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ ඔහු ලංකාව තුළ නොසිටින කාලසීමාව තුළදී ඔහු/ඇය වෙනුවෙන් කටයුතු කරන වෙනත් ඕනෑම නිලධාරියෙකුට රජය විසින් අනෙකුත් ජාත්‍යන්තර සහ අන්තර් රාජ්‍ය සංවිධානවල සංසන්දනාත්මක තරාතිරම්වල නිලධාරීන්ට ලබා දී ඇති වරප්‍රසාද සහ මුක්තිය, නිදහස් කිරීම් සහ පහසුකම් ලබා දිය යුතුය. ඔහුගේ/ඇයගේ සහකරු හෝ සහකාරිය සහ බාලවයස්කාර දරුවන් සම්බන්ධයෙන් ද එම පහසුකම් ලබා දිය යුතුය.

2. රජය විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් එසේ නම් කරන ලද වෙනත් ඕනෑම නිලධාරියෙකුට වෙනත් ජාත්‍යන්තර සහ අන්තර් රාජ්‍ය සංවිධානවල සැසඳිය හැකි තරාතිරම්වල සාමාජිකයින්ට ලබා දී ඇති වරප්‍රසාද සහ මුක්තිය, නිදහස් කිරීම් සහ පහසුකම් ලබා දිය යුතුය. ඔවුන්ගේ සහකරු හෝ සහකාරිය සහ බාල වයස්කාර දරුවන් සම්බන්ධයෙන් ද එම පහසුකම් ලබා දිය යුතුය. මේ සඳහා, අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම නම් කරන ලද නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් සැපයිය යුතු වන අතර, මෙම ලැයිස්තුවේ යම් වෙනස්කමක් සම්බන්ධයෙන් රජයට උපදෙස් දිය යුතුය.

## IX වැනි වගන්තිය

### ද්‍රව්‍ය සහ උපකරණ ආනයනය, අපනයනය, ප්‍රවාහනය සහ භාවිතය

1. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය විසින් 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත, 2015.07.21 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2015 රීති අංක 1 සහ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද සාමාන්‍ය ආරක්ෂණ අවශ්‍යතා (GSR) 3 කොටස සහ අනෙකුත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අදාළ නීති සහ රෙගුලාසිවලට යටත් ව, කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය ලෙස අනාගතයේ දී සංවර්ධනය කළ හැකි මෙහෙයුම් ඇතුළුව එහි මෙහෙයුම් සඳහා අවශ්‍ය යි සලකනු ලබන සියලු ම විද්‍යාත්මක හා ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය, ප්‍රකාශන සහ සැපයුම් ඇතුළුව එවැනි සියලුම ද්‍රව්‍ය, උපකරණ, ලිපි, වාහන, යන්ත්‍ර සූත්‍ර ආනයනය සහ අපනයනය කිරීම සිදුකළ හැකි ය.

2. ඉහත 1 වැනි ඡේදයේ විධිවිධානවලට අගතියකින් තොරව, කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය විසින් පහත කරුණු සඳහා ශ්‍රී ලංකාවේ අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය නිෂ්කාශන ලබාගැනීමට අනුගත විය හැකː

අ. ජාතික භූමියේ නම් කරන ලද හෝ රක්ෂිත කලාපවල පර්යේෂණාත්මක කටයුතු සිදු කිරීම;

ආ. තමන්ගේ ම අරමුණු සඳහා හෝ කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගිතා වැඩසටහන් පිළිබඳ රාමුව තුළ එහි ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අවශ්‍ය විය හැකි විකිරණශීලී ද්‍රව්‍ය හෝ ජීව විද්‍යාත්මක හෝ ජෛව රසායනික ද්‍රව්‍ය ආනයනය, අපනයනය, ප්‍රවාහනය සහ භාවිතය.

3. ඉහත 2(ආ) ඡේදයේ සඳහන් ක්‍රියාකාරකම් සිදු කිරීමේදී, කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය විසින් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

අ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ස්වභාවධර්මය සහ පරිසරය ආරක්ෂා කිරීම සහ ජාතික ආරක්ෂාවට අදාළ නීති රීතිවලට අනුකූල වීම;

ආ. රට තුළට හෝ ඉන් පිටත රෝග සහ පළිබෝධකයන් හඳුන්වාදීම හෝ අපනයනය කිරීම වැළැක්වීම සඳහා ජීව විද්‍යාත්මක හා ජානමය ද්‍රව්‍ය සම්බන්ධයෙන් නිරෝධායනය සහ පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් බලාත්මක වන නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම; සහ

ඇ. සාමාන්‍යයෙන්, මෙම ද්‍රව්‍යවල ආරක්ෂාව සහතික කිරීම සඳහා ජාත්‍යන්තර ආරක්ෂණ ප්‍රමිති සහ පිරිවිතරවල දක්වා ඇති සියලු සාධාරණ පූර්වාරක්ෂාවන් ගැනීම.

## X වැනි වගන්තිය

### කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථාන පරිශ්‍රය

1. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ පරිශ්‍රයන්ට කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය එහි ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අත්පත් කරගෙන සිටින හෝ වාසය කරන ඉඩම සහ පරිපාලන පරිශ්‍රය ඇතුළත් විය යුතු ය. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට සිය ලාංඡනය එහි ගොඩනැගිලි, පහසුකම් සහ උපකරණ මත තැබීමට අවසර දෙනු ලැබේ.

2. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට එහි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අමතර ඉඩමක් අවශ්‍ය වන්නේ නම්, කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට එම ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පහසුකම් සැලසීම රජය විසින් සලකා බැලිය හැක.

## XI වැනි වගන්තිය

### පහසුකම් උල්ලංඝනය නොකළහැකි බව

1. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ පරිශ්‍රය උල්ලංඝනය කළ නොහැකි විය යුතු ය.

2. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ සියලු ම වාර්තා, ලිපි හුවමාරු, ලේඛන සහ අනෙකුත් ද්‍රව්‍ය උල්ලංඝනය කළ නොහැකි විය යුතු ය.

3. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති සහ රෙගුලාසිවලට යටත් ව, එහි ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය සියලු කොන්දේසි ස්ථාපිත කිරීම සඳහා එහි පරිශ්‍රය තුළ රෙගුලාසි අදාළ කිරීම ට කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට බලය ඇත.

4. මෙම ගිවිසුමේ විධිවිධානවලට අගතියකින් තොරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති යටතේ අත්අඩංගුවට ගැනීම වැළැක්වීමට හෝ වෙනත් රටකට හෝ පුද්ගලයන්ට පිටුවහල් කිරීම සඳහා රජයට අවශ්‍ය පුද්ගලයන් හෝ නීතිමය ක්‍රියාවලියේ කටයුතු වලින් වැළකී සිටීමට උත්සාහ දරන අය සඳහා කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය විසින් එහි පරිශ්‍රය රැකවරණයක් වීම වැළැක්විය යුතු ය.

## XII වැනි වගන්තිය

### නීතිමය ක්‍රියාවලියෙන් මුක්තිය

1. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය, එහි දේපළ, වත්කම් සහ අනෙකුත් පහසුකම්, කොතැනක හෝ පිහිටා ඇති සහ කවුරුන්ගේ භාරයේ පැවතියද, කිසියම් විශේෂිත අවස්ථාවක දී එහි මුක්තිය ඉවත් කර තිබේ නම් හැර, සෑම ආකාරයක ම නීතිමය ක්‍රියාවලියකින් මුක්තියක් භුක්ති විඳිය යුතු ය.

## XIII වැනි වගන්තිය

### සන්නිවේදන සහ ප්‍රකාශන

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ නියෝජනයක් ඇති අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන විසින් භුක්ති විඳිනු ලබන එම සැලකීම කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ නිල සන්නිවේදනයන්ට හිමිවිය යුතුය.

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි බලධාරීන්ගේ අනුමැතියට යටත්ව සහ සමාන ස්වභාවයක් ඇති අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සඳහා ඔවුන් විසින් නියම කර ඇති කොන්දේසි යටතේ ගුවන්විදුලි හා විදුලි සංදේශ පහසුකම් ස්ථාපනය කිරීමට හෝ භාවිතා කිරීමට කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වෙත බලය පැවරේ.

3. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භූමි ප්‍රදේශය තුළ එම ලේඛන සහ වාර්තා ප්‍රකාශයට පත් කිරීමට කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට නිදහස තිබේ. කෙසේ වෙතත්, බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති සහ රෙගුලාසිවලට මෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය පාර්ශ්වකරුවකු වන බුද්ධිමය දේපළ පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුම්වලට කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය අනුකූල විය යුතු බව වටහා ගත යුතුය.

## XIV වැනි වගන්තිය

### මූල්‍ය ප්‍රතිපාදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ විනිමය පිළිබඳ නීති සහ රෙගුලාසිවලට යටත්ව;

1. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට ඕනෑම ආකාරයක අරමුදල් හෝ මුදල් වෙන් කර තබා ගත හැකි වන අතර, ඕනෑම මුදල් වර්ගයකින් බැංකු සහ ඒ හා සමාන ගිණුම් පවත්වා ගෙන යා හැක.

2. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට තම අරමුදල් හෝ මුදල් එක් රටක සිට තවත් රටකට හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ නිදහසේ මාරු කළ හැකි වන අතර, එය සතු ඕනෑම මුදල් වර්ගයක් වෙනත් මුදල් ඒකකයකට පරිවර්තනය කර එහි අරමුණු ඉටු කර ගැනීම සඳහා වෙනත් ඕනෑම විදේශ විනිමය මෙහෙයුමක් සිදු කළ හැකිය.

## XV වැනි වගන්තිය

### මුක්තිය අත්හැරීම

මෙම ගිවිසුම යටතේ ලබා දී ඇති මුක්තිය සහ වරප්‍රසාද ලබා දී ඇත්තේ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය හි අවශ්‍යතා සඳහා මිස ඊට සම්බන්ධ පුද්ගලයින්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා නොවේ. අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයාට, ඔහුගේ/ඇයගේ මතය අනුව, එවැනි අයුක්තියක්, යුක්තිය ඉටුවීමට බාධාවක් වන සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ අවශ්‍යතාවලට අගතියක් නොවන පරිදි ඉවත් කළ හැකි අවස්ථාවන්හිදී එවැනි ඕනෑම තැනැත්තෙකුගේ මුක්තිය අත්හැරීම සඳහා වගකීමක් ඇත.

XVI වැනි වගන්තිය

වරප්‍රසාද අනිසි ලෙස භාවිතා කිරීම

1. කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය, එහි අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පදිංචිව සිටින එහි නම් කරන ලද නියෝජිතයන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ යුක්තිය නිසි ලෙස පරිපාලනය කිරීමට සහ නීති පිළිපැදීමට පහසුකම් සැලසීම සඳහා සෑම විටම රජය සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු වන අතර, මෙම ගිවිසුම යටතේ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වෙත ලබා දී ඇති මුක්තිය සහ වරප්‍රසාද අනිසි ලෙස භාවිතා කිරීමෙන් වැළකිය යුතුය.

2. මෙම ගිවිසුම මගින් ලබා දී ඇති වරප්‍රසාදයක් හෝ මුක්තියක් අනිසි ලෙස භාවිතා කර ඇති බවට රජය සලකන්නේ නම්, එවැනි අපයෝජනයක් සිදුවී ඇත්ද යන්න තීරණය කිරීමට සහ නැවත නැවත සිදු නොවන බව සහතික කිරීමට රජය සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය අතර සාකච්ඡා පැවැත්විය යුතුය. වරප්‍රසාදයක් හෝ මුක්තියක් අපයෝජනය කර ඇති බව ඔප්පු වුවහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් XV වැනි වගන්තියේ දක්වා ඇති ක්‍රියා පටිපාටිය වෙත යොමු විය යුතුය.

EOG 09 - 0073/1

---

**1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනත**

**4 වැනි වගන්තිය යටතේ කෙරෙන නියෝගය**

1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව, විදේශ කටයුතු අමාත්‍ය එම්. යූ. එම්. අලි සබ්රි වන මම, 1957 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව සාමාජිකත්වය දරන ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ වරප්‍රසාද සහ මුක්තිය පිළිබඳ ගිවිසුමේ II, III, IV, V, VI සහ VII වගන්තිවල නියමයන් බලාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණයට, මෙහි ඇමුණුම I හි දක්වා ඇති එකී වගන්තිවලට අදාළ විශේෂ කොන්දේසීන්ට යටත්ව, ඉහත සඳහන් පනතේ විධිවිධාන ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය සම්බන්ධයෙන් අදාළ වන බව නියෝග කොට ප්‍රකාශ කරන අතර, එම ගිවිසුමේ අදාළ වගන්ති මෙහි උපලේඛනයේ දක්වා ඇත.

**එම්. යූ. එම්. අලි සබ්රි**, (ජා.නි.පා.ම.)
විදේශ කටයුතු අමාත්‍ය.

2023 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ.

**උපලේඛනය**

**ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ වරප්‍රසාද සහ මුක්තිය පිළිබඳ ගිවිසුම**

II වැනි වගන්තිය

නෛතික පෞරුෂය

2 වැනි ඡේදය

මෙම නියෝජිතායතනයට නෛතික පෞර්ෂයක් තිබිය යුතුය. එයට (අ) කොන්ත්‍රාත්තු සිදු කිරීමට, (ආ) නිශ්චල හා චංචල දේපළ අත්පත් කර ගැනීමට හා බැහැර කිරීමට සහ (ඇ) නීතිමය කටයුතු ආරම්භ කිරීමට ධාරිතාව තිබිය යුතුය.

## III වැනි වගන්තිය

## දේපල, අරමුදල් සහ වත්කම්

3 වැනි ඡේදය

නියෝජිතායතනය, එහි දේපළ සහ වත්කම්, කවර තැනක තිබුණ ද, කවුරුන්ගේ සන්තකයේ පැවතිය ද, යම් විශේෂිත අවස්ථාවක දී පැහැදිලිවම එහි මුක්තිය අත්හැර ඇති අවස්ථාවක දී හැරෙන්නට, සෑම ආකාරයකම නීතිමය ක්‍රියාවලිවලින් මුක්තියක් භුක්ති විඳිය යුතුය. කෙසේ වෙතත්, ඕනෑම මුක්තිය අත්හැරීමක් ක්‍රියාත්මක කිරීමේ කිසිදු පියවරක් දක්වා ව්‍යාප්ත නොවිය යුතු බව වටහාගෙන ගත යුතුය.

4 වැනි ඡේදය

නියෝජිතායතනයේ පරිශ්‍රය අනුල්ලංඝනීය විය යුතුය. නියෝජිතායතනයේ දේපළ සහ වත්කම්, කවර තැනක තිබුණ ද, කවුරුන්ගේ සන්තකයේ පැවතිය ද, විධායක, පරිපාලන, අධිකරණ හෝ ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග මගින් සෙවීම්, ඉල්ලීම් කිරීම, රාජසන්තක කිරීම, අත්පත් කර ගැනීම් සහ වෙනත් ඕනෑම ආකාරයක මැදිහත්වීම්වලින් නිදහස් විය යුතුය.

5 වැනි ඡේදය

නියෝජිතායතනයේ ලේඛනාගාරය, සහ පොදුවේ එයට අයත් හෝ එය සතුව ඇති සියලු ලියකියවිලි, කොතැනක පිහිටා තිබුණත්, උල්ලංඝනය කළ නොහැකි විය යුතුය.

6 වැනි ඡේදය

ඕනෑම ආකාරයක මූල්‍ය පාලනයන්, රෙගුලාසි හෝ තහනම් කිරීම්වලින් සීමා කිරීමකින් තොරව:

(අ) නියෝජිතායතනයට ඕනෑම ආකාරයක අරමුදල්, රත්‍රන් හෝ මුදල් තබා ගත හැකි අතර ඕනෑම මුදල් වර්ගයකින් ගිණුම් පවත්වාගෙන යා හැකිය;

(ආ) නියෝජිතායතනයට එහි අරමුදල්, රත්‍රන් හෝ මුදල් එක් රටක සිට තවත් රටකට හෝ ඕනෑම රටක් තුළ නිදහසේ මාරු කළ හැකි වන අතර, එය සතු ඕනෑම මුදල් වර්ගයක් වෙනත් මුදල් වර්ගයකට පරිවර්තනය කළ හැකිය.

7 වැනි ඡේදය

නියෝජිතායතනය, 6 වැනි ඡේදය යටතේ සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී, එම නියෝජනයන්ට නියෝජිතායතනයේ අවශ්‍යතාවලට හානියක් නොවන පරිදි බලපෑමක් ඇති කළ හැකි බව සලකනු ලබන විට දී මෙම ගිවිසුමට කිසියම් රාජ්‍ය පාර්ශ්වයක රජය විසින් කරනු ලබන ඕනෑම නියෝජනයක් සඳහා නිසි සැලකිල්ලක් දැක්විය යුතුය.

8 වැනි වගන්තිය

නියෝජිතායතනය, එහි වත්කම්, ආදායම සහ අනෙකුත් දේපල:

(අ) සියලු සෘජු බදුවලින් නිදහස් කළ යුතුය; කෙසේ වෙතත්, මහජන උපයෝගිතා සේවා සඳහා වන ගාස්තුවලට වඩා වැඩි යමක් නොවන බදුවලින් නිදහස් කිරීමක් නියෝජිතායතනය විසින් ඉල්ලා නොසිටින බව වටහා ගනු ලැබේ;

(ආ) නියෝජිතායතනය විසින් සිය නිල භාවිතය සඳහා ආනයනය කරන ලද හෝ අපනයනය කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් රේගු බදු සහ තහනම් කිරීම් සහ ආනයන සහ අපනයන සීමා කිරීම්වලින් නිදහස් කිරීම; කෙසේ වෙතත්, එවැනි නිදහස් කිරීම් යටතේ ආනයනය කරන ලද භාණ්ඩ, එම රටේ රජය සමඟ එකඟ වූ කොන්දේසි යටතේ මිස, ඒවා ආනයනය කළ රට තුළ දී විකුණනු නොලබන බව වටහා ගනු ලැබේ;

(ඇ) එහි ප්‍රකාශන සම්බන්ධයෙන් ආනයන හා අපනයන සීමා කිරීම් සහ තීරුබදු සහ තහනම් කිරීම් වලින් නිදහස් කිරීම.

9 වැනි ඡේදය

නියෝජිතායතනය සාමාන්‍ය රීතියක් ලෙස, සුරාබදු බදුවලින් සහ ගෙවිය යුතු මිලෙන් කොටසක් වන වංචල සහ නිශ්චල දේපල විකිණීමේ බදු වලින් නිදහස් කිරීමක් ඉල්ලා නොසිටින අතර, කෙසේ වෙතත්, දේපල නිල භාවිතය සඳහා නියෝජිතායතනය වැදගත් මිලදී ගැනීම් සිදු කරන විට එවැනි තීරුබදු සහ බදු අය කර ඇති හෝ අය කළ හැකි නම්, මෙම ගිවිසුමේ රාජ්‍ය පාර්ශ්වයන් විසින් හැකි සෑම විටම, තීරුබදු හෝ බදු ප්‍රමාණය අඩු කිරීම හෝ ආපසු ලබා දීම සඳහා සුදුසු පරිපාලන විධිවිධාන සලසනු ඇත.

## IV වැනි වගන්තිය

## සන්නිවේදන සම්බන්ධ පහසුකම්

10 වැනි ඡේදය

නියෝජිතායතනය, මෙම ගිවිසුම සඳහා එක් එක් රාජ්‍ය පාර්ශ්වයේ භූමිය තුළ සහ එම රාජ්‍යය පාර්ශ්වයක් වන ඕනෑම ජාත්‍යන්තර සම්මුතීන්, රෙගුලාසි සහ විධිවිධානවලට අනුකූල විය හැකි තාක් දුරට, තැපැල් සහ විදුලි සංදේශ සඳහා ප්‍රමුඛතා, ගාස්තු සහ බදු සහ පුවත්පත් සහ ගුවන්විදුලිය සඳහා තොරතුරු සඳහා මුද්‍රණ ගාස්තු සම්බන්ධයෙන්, එවැනි රාජ්‍යයක රජය විසින් එම දෙවැනි රටේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලය ඇතුළුව වෙනත් ඕනෑම රජයකට ලබා දෙන ලබන ප්‍රමාණයට වඩා අඩු නොවන සැලකිල්ලක් එහි නිල සන්නිවේදනයන් සඳහා භුක්ති විඳිය යුතුය.

11 වැනි ඡේදය

නියෝජිතායතනයේ නිල ලිපි හුවමාරුව සහ අනෙකුත් නිල සන්නිවේදනයන් සඳහා වාරණයක් නොයෙදිය යුතුය. කේත භාවිතා කිරීමට, ලිපි හුවමාරු කිරීමට සහ රාජ්‍යතාන්ත්‍රික කුරියර් සහ මලුවලට සමාන මුක්තිය සහ වරප්‍රසාද සහිතව කුරියර් මගින් හෝ මුද්‍රා තැබූ මලුවල වෙනත් නිල සන්නිවේදනයන් යැවීමට සහ ලබා ගැනීම සඳහා නියෝජිතායතනයට අයිතිය තිබිය යුතුය. මෙම ගිවිසුමේ රාජ්‍ය පාර්ශ්වයක් සහ නියෝජිතායතනය අතර එකඟතාවයකින් යුතුව තීරණය කළ යුතු සුදුසු ආරක්ෂක පූර්වාරක්ෂාවන් අනුගමනය කිරීම වැළැක්වීම සඳහා මෙම වගන්තියේ අඩංගු කිසිවක් අර්ථකථනය නොකළ යුතුය.

## V වැනි වගන්තිය

## සාමාජිකයින්ගේ නියෝජිතයන්

12 වැනි ඡේදය

නියෝජිතායතනය විසින් කැඳවන ලද රැස්වීම්වල දී සාමාජිකයින්ගේ නියෝජිතයින් විසින් ඔවුන්ගේ කාර්යයන් ඉටු කරන අතරතුර දී සහ රැස්වීම් ස්ථානයට සහ ඉන් පිටතට ගමන් කරන විට දී, පහත සඳහන් වරප්‍රසාද සහ මුක්තිය භුක්ති විඳිය යුතු යඃ

(අ) පුද්ගලිකව අත් අඩංගුවට ගැනීමෙන් හෝ රඳවා තබා ගැනීමෙන් සහ ඔවුන්ගේ පුද්ගලික ගමන් මලු පරිග්‍රහනයෙන්, සහ කතා කරන හෝ ලියා ඇති වචන සහ ඔවුන්ගේ නිල බලයෙන් ඔවුන් විසින් කරන ලද සියලු ක්‍රියා සම්බන්ධයෙන්, සෑම ආකාරයකම නීතිමය ක්‍රියාවලියකින් මුක්තිය;

(ආ) සියලු කඩදාසි සහ ලේඛන සඳහා අනුල්ලංඝනීය භාවය;

(ඇ) කේත භාවිතා කිරීමට සහ කුරියර් මගින් හෝ මුද්‍රා තැබූ මලුවල කඩදාසි හෝ ලිපි හුවමාරු කිරීමට ඇති අයිතිය;

(ඈ) ඔවුන් සංචාරය කරන හෝ ඔවුන් ගමන් කරන රාජ්‍යයේ සංක්‍රමණ සීමා කිරීම්, විදේශිකයන්ගේ ලියාපදිංචිය හෝ ජාතික සේවා වගකීම්වලින් තමන් සහ ඔවුන්ගේ කලත්‍රයන් නිදහස් කිරීම;

(ඉ) තාවකාලික නිල දූත මෙහෙවර සඳහා විදේශ රජයන්හි නියෝජිතයින්ට ලබා දෙනු ලබන මුදල් හෝ විනිමය සීමා කිරීම් සම්බන්ධයෙන් අදාළ පහසුකම්;

(ඊ) රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල සංසන්දනාත්මක තරාතිරමේ සාමාජිකයින්ට ඔවුන්ගේ පුද්ගලික ගමන් මලු සම්බන්ධයෙන් ලබා දී ඇති මුක්තිය සහ පහසුකම්.

13 වැනි ඡේදය

නියෝජිතායතනය විසින් කැඳවන ලද රැස්වීම්වල දී නියෝජිතායතනයේ සාමාජිකයින්ගේ නියෝජිතයින් සඳහා පූර්ණ භාෂණයේ නිදහස සහ ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේ දී සම්පූර්ණ ස්වාධීනත්වය, කථා කරන හෝ ලිඛිත වචන සහ ඔවුන් විසින් කරන ලද

සියලුම ක්‍රියා සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාවලියෙන් මුක්තිය සුරක්ෂිත කිරීම සඳහා අදාළ පුද්ගලයින් තවදුරටත් එම රාජකාරි ඉටුකිරීමේ නිරතව නොසිටිය ද, ඔවුන්ගේ රාජකාරි ඉටුකිරීමේ දී අඛණ්ඩව ලබාදිය යුතුය.

14 වැනි ඡේදය

කිසියම් ආකාරයක බදු අයකිරීමක්, පදිංචිය මත රඳා පවතින විට, නියෝජිතායතනය විසින් කැඳවන ලද රැස්වීම්වල දී නියෝජිතායතනයේ සාමාජිකයින්ගේ නියෝජිතයන් ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීම සඳහා සාමාජික රාජ්‍යයක ගතකරන කාල සීමාවන්, පදිංචි කාල සීමාවන් ලෙස නොසැලකිය යුතු ය.

15 වැනි ඡේදය

සාමාජිකයින්ගේ නියෝජිතයින්ට වරප්‍රසාද සහ මුක්තිය පිරිනමනු ලබන්නේ පුද්ගලයන්ගේ පුද්ගලික ප්‍රයෝජනය සඳහා නොව, නියෝජිතායතනය හා සම්බන්ධව ඔවුන්ගේ කාර්යයන් ස්වාධීනව ක්‍රියාත්මක කිරීම ආරක්ෂා කිරීම සඳහා ය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාමාජිකයාගේ මතය අනුව, යුක්තිය ඉටුවීමට බාධාවක් වන ඕනෑම අවස්ථාවක සහ මුක්තිය ලබා දෙන අරමුණ සඳහා අගතියකින් තොරව එය අත්හැරිය හැකි ඕනෑම අවස්ථාවක දී තම නියෝජිතයින්ගේ මුක්තිය අත්හැරීමට සාමාජිකයෙකුට අයිතියක් පමණක් නොව යුතුකමක් ද ඇත.

16 වැනි ඡේදය

යම් පුද්ගලයෙකු, ජාතිකයෙකු හෝ නියෝජිතයෙකු වන වෙනත් රාජ්‍යයක අධිකාරීන් සම්බන්ධයෙන් 12 වෙනි, 13 වෙනි සහ 14 වෙනි වගන්තිවල විධිවිධාන අදාල නොවේ.

## VI වැනි වගන්තිය

## නිලධාරීන්

17 වැනි ඡේදය

නියෝජිතායතනය වරින් වර මෙම ගිවිසුමට සම්බන්ධ සියලුම රාජ්‍ය පාර්ශ්වයන්ගේ රජයන්ට මෙම වගන්තියේ සහ IX වැනි වගන්තියේ විධිවිධාන අදාළ වන නිලධාරීන්ගේ නම් දැනුම් දිය යුතු ය.

18 වැනි ඡේදය

අ. නියෝජිතායතනයේ නිලධාරීන්:

(i) කථා කරන හෝ ලියා ඇති වචන සහ ඔවුන්ගේ නිල මට්ටමින් ඔවුන් විසින් සිදු කරන ලද සියලුම ක්‍රියා සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාවලියෙන් නිදහස් විය යුතුය;

(ii) නියෝජිතායතනය විසින් ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා සම්බන්ධයෙන් බදු අයකිරීමෙන් නිදහස් කිරීම් සහ එක්සත් ජාතීන්ගේ නිලධාරීන් භුක්ති විඳින කොන්දේසි මත ම භුක්ති විඳිය යුතුය;

(iii) ඔවුන්ගේ සහකරු හෝ සහකාරිය සහ ඔවුන් මත යැපෙන ඥාතීන් සමඟ සංක්‍රමණ සීමා කිරීම් සහ අන්‍ය ජාතිකයෙකු ලියාපදිංචියෙන් මුක්තිය ලැබිය යුතුය;

(iv) රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල සම තරාතිරමේ නිලධාරීන්ට ලබා දී ඇති හුවමාරු පහසුකම් සම්බන්ධයෙන් වූ සම වරප්‍රසාද ලැබිය යුතුය;

(v) ජාත්‍යන්තර අර්බුදවලදී ඔවුන්ගේ සහකරු හෝ සහකාරිය සහ ඔවුන් මත යැපෙන ඥාතීන් සමඟ සන්සන්දනාත්මක මට්ටමේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල නිලධාරීන්ට සමාන නැවත සියරට පැමිණවීමේ පහසුකම් ලැබිය යුතුය;

(vi) අදාළ රටෙහි තම තනතුර පළමු වරට භාර ගන්නා අවස්ථාවේ දී ඔවුන්ගේ ගෘහ භාණ්ඩ සහ භාණ්ඩ තීරුබදු රහිතව ආනයනය කිරීම සඳහා අයිතිය තිබිය යුතුය.

ආ. නියෝජිතායතනයේ නිලධාරීන් විසින්, නියෝජිතායතනයේ ප්‍රඥප්තියේ XII වගන්තිය යටතේ පරීක්ෂකවරයෙකුගේ හෝ එහි XI වගන්තිය යටතේ ව්‍යාපෘති විභාග නිලධාරියෙකුගේ කර්තව්‍යයන් ක්‍රියාත්මක කරන අතරතුරදී සහ මෙම කාර්යයන් ඉටු කරන ස්ථානය වෙත සහ ඉන් පිටතට ඔවුන්ගේ නිලධාරී මට්ටමින් ගමන් කරන අතරතුරදී, එවැනි කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන තාක් දුරට මෙම ගිවිසුමේ VII වගන්තියේ දක්වා ඇති සියලු අමතර වරප්‍රසාද සහ මුක්තිය භුක්ති විඳිය යුතුය.

19 වැනි ඡේදය

නියෝජිතායතනයේ නිලධාරීන් ජාතික සේවා වගකීම්වලින් නිදහස් කළ යුතු වන අතර, ඔවුන් ජාතිකයන් වන රාජ්‍යවලට අදාළව, එවැනි නිදහස් කිරීම් ඔවුන්ගේ රාජකාරි හේතුවෙන්, නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සම්පාදනය කරන ලද සහ අදාළ රාජ්‍යය විසින් අනුමත කරන ලද ලැයිස්තුවක් මගින් නම් කර ඇති නියෝජිතායතනයේ නිලධාරීන්ට පමණක් සීමා වේ.

නියෝජිතායතනයේ අනෙකුත් නිලධාරීන් ජාතික සේවය සඳහා කැඳවනු ලැබුවහොත්, අදාළ රාජ්‍යය, නියෝජිතායතනයේ ඉල්ලීම පරිදි, අත්‍යවශ්‍ය වැඩ කටයුතු කරගෙන යාමේ බාධා වළක්වා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි නිලධාරීන් කැඳවීමේ දී එවැනි තාවකාලික කල් දැමීමක් ලබා දිය යුතුය.

20 වැනි ඡේදය

ඉහත 18 වැනි සහ 19 වැනි වගන්තිවල නිශ්චිතව දක්වා ඇති වරප්‍රසාද සහ මුක්තීන්ට අමතරව, නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල් වරයා ඇතුළුව, ඔහු රාජකාරියේ නොමැති විට ඔහු වෙනුවෙන් ක්‍රියා කරන ඕනෑම නිලධාරියෙකු, ජාත්‍යන්තර නීතියට අනුකූලව තමන්, තම සහකරු හෝ සහකාරිය සහ බාලවයස්කාර දරුවන් වෙනුවෙන් රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයින්ට ලබා දී ඇති වරප්‍රසාද සහ මුක්තීන්, නිදහස් කිරීම් සහ පහසුකම් ඔහු වෙනුවෙන්, ඔහුගේ සහකරු හෝ සහකාරිය සහ බාල වයස්කාර දරුවන් වෙනුවෙන් ප්‍රදානය කළ යුතුය. එම වරප්‍රසාද සහ මුක්තීන්, නිදහස් කිරීම් සහ පහසුකම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුට හෝ නියෝජිතායතනයේ සමාන තරාතිරමේ නිලධාරියෙකුට ද ලබා දිය යුතුය.

21 වැනි ඡේදය

නිලධාරීන්ට වරප්‍රසාද සහ මුක්තිය ලබා දෙන්නේ නියෝජිතායතනයේ අවශ්‍යතා සඳහා මිස, පුද්ගලයන්ගේ පුද්ගලික ප්‍රයෝජනය සඳහා නොවේ. සිය මතය අනුව, යුක්තිය පසිඳලීම සඳහා බාධාවක් වන සහ නියෝජිතායතනයේ අවශ්‍යතාවලට අගතියක් නොවන පරිදි ඉවත් කළ හැකි ඕනෑම අවස්ථාවක දී, ඕනෑම නිලධාරියෙකුගේ මුක්තිය අත්හැරීමට නියෝජිතායතනයට අයිතියක් සහ යුතුකමක් ඇත.

22 වැනි ඡේදය

නිසි යුක්තිය පසිඳලීමට පහසුකම් සැලසීමට, පොලිස් රෙගුලාසි පිළිපැදීම සුරක්ෂිත කිරීමට සහ මෙම වගන්තියේ සඳහන් වරප්‍රසාද, ප්‍රතිශක්තීකරණ සහ පහසුකම් සම්බන්ධව කිසියම් අපයෝජනයක් සිදුවීම වැළැක්වීම සඳහා නියෝජිතායතනය සාමාජික රටවල සුදුසු බලධාරීන් සමඟ සෑම විටම සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

## VII වැනි වගන්තිය

### නියෝජිතායතනය සඳහා මෙහෙවර පිළිබඳ විශේෂඥයින්

23 වැනි ඡේදය

නියෝජිතායතනයේ ප්‍රඥප්තියේ XII වගන්තිය යටතේ පරීක්ෂකවරුන් ලෙසත් එහි XI වගන්තිය යටතේ ව්‍යාපෘති පරීක්ෂකවරුන් ලෙසත් ඉටුකරන මෙහෙවර ඇතුළුව නියෝජිතායතනයේ කමිටුවල හෝ නියෝජිතායතනය සඳහා දූත මෙහෙවර ඉටු කරන විශේෂඥයන් (VI වැනි වගන්තියේ විෂය පථයට අයත් නිලධාරීන් හැර) සඳහා එවැනි කමිටුවල සේවයට සම්බන්ධව ගමන් බිමන් සඳහා ගත කරන කාලය ද ඇතුළුව, ඔවුන්ගේ කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි පහත සඳහන් වරප්‍රසාද සහ මුක්තිය ලබා දී ඇත.

අ) පුද්ගලිකව අත්අඩංගුවට ගැනීමෙන් හෝ රඳවා තබා ගැනීමෙන් සහ ඔවුන්ගේ පුද්ගලික ගමන්මලු පරිග්‍රහනයට ගැනීමෙන් නිදහස් වීම;

ආ) ඔවුන්ගේ නිල කාර්යයන් ඉටු කිරීමේදී ඔවුන් විසින් කථා කරන ලද හෝ ලියා ඇති වචන හෝ කරන ලද ක්‍රියාවන් සම්බන්ධයෙන්, සෑම ආකාරයකම නීතිමය ක්‍රියාවලියකින් මුක්තිය සහ අදාළ පුද්ගලයින් තවදුරටත් කම්ටුවල සේවය නොකරන විට හෝ නියෝජිතායතනය සඳහා මෙහෙවර සේවයේ යෙදී නොසිටින විට දී එවැනි මුක්තිය අඛණ්ඩව පවත්වාගෙන යාම;

ඇ) සියලු ම කඩදාසි සහ ලේඛන සඳහා අනුල්ලංඝනීයභාවය;

ඈ) නියෝජිතායතනය සමඟ ඔවුන්ගේ සන්නිවේදනයේ අරමුණු සඳහා, කේත භාවිතා කිරීමට සහ කුරියර් මගින් හෝ මුද්‍රා තැබූ මලුවල කඩදාසි හෝ ලිපි හුවමාරු කර ගැනීමේ අයිතිය;

ඉ) තාවකාලික නිල දූතමෙහෙවරවල දී විදේශ රජයන්හි නියෝජිතයින්ට ලබා දී ඇති පරිදි මුදල් හා විනිමය සීමා කිරීම් සම්බන්ධයෙන් අදාළ පහසුකම්;

ඊ) රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල සම තරාතිරමේ සාමාජිකයින්ට ලබා දී ඇති ඔවුන්ගේ පුද්ගලික ගමන් මලු සම්බන්ධයෙන් අදාළ මුක්තිය සහ පහසුකම්.

24 වැනි ඡේදය

මෙම ගිවිසුමේ රාජ්‍ය පාර්ශ්වයක් සහ නියෝජිතායතනය අතර එකඟතාවයකින් තීරණය කළ යුතු සුදුසු ආරක්ෂක පූර්වාරක්ෂාවන් අනුගමනය කිරීම වැළැක්වීම සඳහා 23 වැනි වගන්තියේ (ඇ) සහ (ඈ) උප ඡේදවල කිසිවක් අර්ථ දැක්විය යුතු නැත.

25 වැනි ඡේදය

නියෝජිතායතනයේ විශේෂඥයන්ට වරප්‍රසාද සහ මුක්තීන් ප්‍රදානය කරනු ලබන්නේ නියෝජිතායතනයේ අවශ්‍යතා සඳහා මිස පුද්ගලයන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා නොවේ. ඕනෑම අවස්ථාවක දී ඕනෑම විශේෂඥයෙකුගේ මුක්තිය අත්හැරීම සඳහා නියෝජිතායතනයට අයිතියක් සහ යුතුකමක් ඇති අතර, එහි මතය අනුව එම මුක්තිය යුක්තිය පසිඳලීම සඳහා බාධාවක් වන්නේ නම්, නියෝජිතායතනයේ අවශ්‍යතාවලට අගතියක් නොවන පරිදි එය අත්හැරිය හැකිය.

**ඇමුණුම I**

i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය, II වැනි වගන්තිය යටතේ නිශ්චල දේපළ අත්පත් කර ගැනීමට සහ බැහැර කිරීමට ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සතු හැකියාව, ජාතික නීති සහ රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු බව මෙයින් ප්‍රකාශ කරයි.

ii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය, 18 (II), (III), (IV) සහ (V) ඡේදවල සපයා ඇති වරප්‍රසාද සහ මුක්තීන් භාවිත කිරීම, ශ්‍රී ලංකාවේ සේවය කරන ශ්‍රී ලාංකික ජාතිකයින් වන ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ නිලධාරීන් සඳහා ලබා දෙනු නොලබන බව ප්‍රකාශ කරයි.

iii. කථා කරන හෝ ලිඛිත වචන හෝ ඔවුන්ගේ නිල කාර්යයන් ඉටු කිරීමේදී කරන ලද ක්‍රියාවන් සම්බන්ධයෙන් ලබා දී ඇති මුක්තිය හැරෙන්නට 23 (අ), 23 (ආ) ඡේදවල සපයා ඇති වරප්‍රසාද සහ මුක්තීන්, නිල පත්‍රිකා සහ ලේඛන සඳහා ලබා දී ඇති මුක්තිය හැර 23 (ඇ) වගන්තියේ සපයා ඇති වරප්‍රසාද සහ මුක්තීන් සහ 23 (ඉ) ඡේදයේ සපයා ඇති වරප්‍රසාද සහ මුක්තීන්, ශ්‍රී ලංකාවේ සේවය කරන ශ්‍රී ලාංකික ජාතිකයින් වන ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ නිලධාරීන් වෙත ලබා නොදිය යුතුය.

iv. 20 සහ 32 යන ඡේදවල කෙසේ සඳහන් වුවද, වරිපනම් බදු, තීරුබදු සහ සුරාබදු බදු සම්බන්ධ ජාතික නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අයිතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය රඳවා තබා ගනී.

v. 6 වැනි ඡේදය යටතේ අරමුදල්, රත්‍රන් හෝ ඕනෑම ආකාරයක මුදල් සහ ඕනෑම මුදල් ඒකකයක ගිණුම් තබා ගැනීමට සහ ශ්‍රී ලංකා භූමිය තුළ දී එවැනි මුදල් හුවමාරු කිරීමට සහ පරිවර්තනය කිරීමට අදාළ විධිවිධාන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය තුළ ක්‍රියාත්මක වන අදාළ ජාතික නීතිමය ප්‍රතිපාදනවලට යටත් විය යුතුය.

EOG 09- 0073/2

**1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනත**

4 වැනි වගන්තිය යටතේ නියෝගය

1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව, විදේශ කටයුතු අමාත්‍ය එම්. යූ. එම්. අලි සබ්රි වන මම, 2023 පෙබරවාරි 07 වැනි දින අත්සන් තබන ලද ගෝලීය හරිත වර්ධන ආයතනයේ (GGGI) නෛතික තත්ත්වය, වරප්‍රසාද සහ මුක්තිය පිළිබඳ ගිවිසුමේ 2, 3, 4, 5, 6, 7, 9, 10 සහ 11 යන වගන්තිවල නියමයන් බලාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණයට, ඉහත සඳහන් පනතේ විධිවිධාන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ ගෝලීය හරිත වර්ධන ආයතනය (GGGI) අතර පවතින ගිවිසුම සම්බන්ධයෙන් අදාළ වන බව නියෝග කොට ප්‍රකාශ කරන අතර, එම ගිවිසුමේ අදාළ වගන්ති මෙහි උපලේඛනයෙන් කියවනු ලැබේ.

**එම්. යූ. එම්. අලි සබ්රි,** (ජා.නි.පා.ම.),
විදේශ කටයුතු අමාත්‍ය.

2023 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ.

**උපලේඛනය**

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ රජය සහ ගෝලීය හරිත වර්ධන ආයතනයේ (GGGI) නෛතික තත්ත්වය, වරප්‍රසාද සහ මුක්තිය පිළිබඳ ගිවිසුම

2 වැනි වගන්තිය

නෛතික පෞරුෂය සහ ශක්නුතාව

(1) ගෝලීය හරිත වර්ධන ආයතනය යනු ජාත්‍යන්තර නීතිමය පෞරුෂයක් සහිත ජාත්‍යන්තර සංවිධානයකි.

(2) ගෝලීය හරිත වර්ධන ආයතනයට (i) කොන්ත්‍රාත්තුවලට එළඹීම, (ii) නිශ්චල හා චංචල දේපළ අත්පත් කර ගැනීම හා බැහැර කිරීම සහ (iii) නීතිමය ක්‍රියාමාර්ගයන් ආරම්භ කිරීම සඳහා අධිකරණමය පෞරුෂයක් සහ නෛතික හැකියාවක් තිබිය යුතුය.

(3) ගෝලීය හරිත වර්ධන ආයතනයට ජාත්‍යන්තර සංවිධානයකට අයත් ස්වාධීනත්වය සහ ක්‍රියා කිරීමේ නිදහස තිබිය යුතුය.

3 වැනි වගන්තිය

දේපල සහ වත්කම්

(1) ගෝලීය හරිත වර්ධන ආයතනය සහ එහි දේපල සහ වත්කම්, කොතැනක පැවතියද සහ කවුරුන් සන්තකයේ පැවතියද, යම්කිසි අවස්ථාවක දී එය ප්‍රකාශිතව එහි මුක්තිය අත්හැර ඇති තාක් දුරට හැර, සෑම ආකාරයකම නීතිමය ක්‍රියාවලියකින් මුක්තියක් භුක්ති විඳිය යුතුය. කෙසේ වෙතත්, වෙනත් ආකාරයකින් විශේෂයෙන්ම ප්‍රකාශ කරන්නේ නම් මිස, කිසිදු ක්‍රියාත්මක කිරීමේ පියවරක් දක්වා කිසිදු මුක්තියක් අත්හැරීමක් ව්‍යාප්ත නොවිය යුතු බව වටහාගත යුතුය.

(2) ගෝලීය හරිත වර්ධන ආයතනය සතු දේපළ සහ වත්කම්, කොතැනක පැවතියද සහ කවුරුන් සන්තකයේ පැවතියද, විධායක, පරිපාලන, අධිකරණ හෝ ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග මගින් සෙවීම, අධිග්‍රහණය, රාජසන්තක කිරීම, අත්පත් කර ගැනීම් හෝ වෙනත් ආකාරයක මැදිහත්වීම්වලින් නිදහස් විය යුතුය.

(3) ගෝලීය හරිත වර්ධන ආයතනයේ ලේඛනාගාරය කොතැනක පිහිටා තිබුණද, එය උල්ලංඝනය කළ නොහැකි විය යුතුය.

(4) ගෝලීය හරිත වර්ධන ආයතනයේ අරමුණ සහ කර්තව්‍යයන් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට සහ මෙම ගිවිසුමේ විධිවිධානවලට සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති සහ රෙගුලාසිවලට යටත්ව, ගෝලීය හරිත වර්ධන ආයතනයේ සියලු දේපළ සහ වත්කම් ඕනෑම ස්වභාවයක සීමා කිරීම්, රෙගුලාසි, පාලනයන් සහ තහනම් කිරීම්වලින් නිදහස් විය යුතුය.

## 4 වැනි වගන්තිය

## බදු සහ රේගු බදුවලින් නිදහස් කිරීම

(1) ගෝලීය හරිත වර්ධන ආයතනය, එහි වත්කම්, ආදායම සහ අනෙකුත් දේපළ:

(අ) සපයනු ලබන නිශ්චිත සේවාවන් සඳහා ප්‍රමාණවත් වන ගාස්තුවලට හැර, අනෙකුත් සියලුම සෘජු බදුවලින් නිදහස් කළ යුතුය;

(ආ) ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් එහි නිල භාවිතය සඳහා ආනයනය කරන ලද හෝ අපනයනය කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් සහ එය විසින් ආනයනය කරන ලද හෝ අපනයනය කරන ලද ගෝලීය හරිත වර්ධන ආයතනයේ කිසියම් ප්‍රකාශනයක් සම්බන්ධයෙන් ආනයන සහ අපනයන තහනම් කිරීම් සහ සීමා කිරීම්වලින් නිදහස් කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි නිදහස් කිරීම් යටතේ ආනයනය කරන ලද භාණ්ඩ රජය සමඟ එකඟ වූ කොන්දේසි යටතේ මිස, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භූමි ප්‍රදේශය තුළදී විකුණනු ලැබිය නොහැකිය; සහ

(ඇ) ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් එහි නිල භාවිතය සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ ආනයනය කිරීමේදී හෝ රජය විසින් නියම කළ හැකි උපදේශනවලට අනුකූලව සංවිධානයේ ප්‍රකාශන ආනයනය කිරීමේදී රේගු බදුවලින් නිදහස් විය යුතුය.

(2) ගෝලීය හරිත වර්ධන ආයතනය සිය නිල භාවිතය සඳහා දේශීයව මිලදී ගන්නා ද්‍රව්‍ය බදුවලින් නිදහස් කෙරේ. එවැනි සහන, විධිවිධානවලට අනුකූලව රජය විසින් පනවනු ලැබිය හැකි එවැනි කොන්දේසිවලට යටත්විය යුතුය.

(3) ගෝලීය හරිත වර්ධන ආයතනය, එහි නිලධාරීන් සහ විශේෂඥයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කම්කරු හා සමාජ ආරක්ෂණය පිළිබඳ රෙගුලාසිවලට යටත් නොවිය යුතුය.

(4) ගෝලීය හරිත වර්ධන ආයතනය මහජන උපයෝගිතා ගාස්තු හැර වෙනත් ඕනෑම බද්දක් හෝ තීරුබද්දක් ගෙවීමෙන්, රඳවා තබා ගැනීමෙන් හෝ එකතු කිරීමෙන් නිදහස් කළ යුතුය. ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් ඔවුන්ට ගෙවනු ලබන වැටුප්, දීමනා සහ දීමනා සම්බන්ධයෙන් හෝ අදාළ සියලු ආකාරයේ බදුවලින් නිලධාරීන් නිදහස් කළ යුතුය.

## 5 වැනි වගන්තිය

## සන්නිවේදන

(1) ගෝලීය හරිත වර්ධන ආයතනයේ නිල සන්නිවේදනයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් වෙනත් ඕනෑම ජාත්‍යන්තර සංවිධානයකට සලකනු ලබන ආකාරයට සලකනු ලැබිය යුතුය.

(2) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භූමි ප්‍රදේශයෙන් සහ ඒ හරහා සම්ප්‍රේෂණය කරනු ලබන ඕනෑම ආකාරයකින් හෝ ඕනෑම ආකාරයක සන්නිවේදනයක් වාරණයෙන් සහ වෙනත් ඕනෑම ආකාරයක අර්ථකථනයකින් හෝ ඔවුන්ගේ පෞද්ගලිකත්වයට මැදිහත් වීමෙන් ආරක්ෂා විය යුතුය. රජය සහ ගෝලීය හරිත වර්ධන ආයතනය අතර උපදේශනයෙන් පසුව තීරණය කළ යුතු සුදුසු ආරක්ෂක පූර්වාරක්ෂාවන් අනුගමනය කිරීම මෙය මඟින් වළක්වන්නේ නැත.

(3) ගෝලීය හරිත වර්ධන ආයතනයට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ දී කේත භාවිතා කිරීමට සහ කුරියර් මගින් හෝ මුද්‍රා තැබූ මලුවල ලිපි හුවමාරු කිරීමට සහ වෙනත් සන්නිවේදනයන් යැවීමට සහ ලබා ගැනීමට අයිතිය තිබිය යුතු වන අතර, සමාන ජාත්‍යන්තර සංවිධානවල කුරියර් සහ මලුවලට ලබා දී ඇති ඒවාට වඩා අඩු නොවන මුක්ති සහ වරප්‍රසාද ඒ සඳහා පැවතිය යුතුය. මෙම මලුවල දෘශ්‍යමාන ලෙස ගෝලීය හරිත වර්ධන ආයතනයේ ලාංඡන තිබිය යුතු වන අතර, නිල භාවිතය සඳහා අදහස් කරන ලියකියවිලි හෝ ලිපි පමණක් එහි අඩංගු විය යුතු වන අතර, කුරියර් ආයතනයට ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් නිකුත් කරන ලද කුරියර් සහතිකයක් ලබා දිය යුතුය.

6 වැනි වගන්තිය

එක්රැස්වීමේ, රැස්වීම් පැවැත්වීමේ සහ සම්මන්ත්‍රණ පැවැත්වීමේ නිදහස

(1) රජයේ එකඟතාවය ඇතිව ගෝලීය හරිත වර්ධන ආයතනයට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ රැස්වීම් කැඳවිය හැක.

(2) ශ්‍රී ලංකාවේ නීති සහ රෙගුලාසිවලට යටත්ව, ගෝලීය හරිත වර්ධන ආයතනය සහ එහි නිලධාරීන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ දී රැස්වීමේ, සාකච්ඡා කිරීමේ සහ තීරණ ගැනීමේ නිදහස භුක්ති විඳිය යුතුය.

(3) ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් සංවිධානය කරන ලද රැස්වීම් සඳහා ආරාධනා කරන ලද සහ පිළිගනු ලබන සියලු ම පුද්ගලයින්ගේ වීසා බලපත්‍ර සහ ප්‍රවේශ බලපත්‍ර සම්බන්ධයෙන්, අවශ්‍ය වූ විට, අදාළ නීතිවලට අනුකූලව හැකිතාක් ඉක්මනින් කටයුතු කළ යුතුය.

7 වැනි වගන්තිය

ධජය, ලාංඡනය සහ සලකුණු

ගෝලීය හරිත වර්ධන ආයතනයට එහි ධජය සහ/හෝ වෙනත් හඳුනාගැනීමේ සලකුණු එහි පරිශ්‍රයේ සහ වාහනවල ප්‍රදර්ශනය කිරීමට අයිතිය ඇත.

8 වැනි වගන්තිය

ගෝලීය හරිත වර්ධන ආයතනයේ සම්මේලනය, කවුන්සිලය සහ උපදේශක කමිටුව සංස්ථාපනය කරනු ලබන ගෝලීය හරිත වර්ධන ආයතනයේ නියෝජිතයින්, සාමාජිකයින්, නිලධාරීන්, විශේෂඥයින් සහ වෙනත් පුද්ගලයින් පිළිබඳ වරප්‍රසාද සහ මුක්තිය

(1) ගෝලීය හරිත වර්ධන ආයතනයේ සම්මේලනය, කවුන්සිලය සහ උපදේශක කමිටුව සංස්ථාපනය කරනු ලබන ගෝලීය හරිත වර්ධන ආයතනයේ නියෝජිතයින්, සාමාජිකයින්, නිලධාරීන්, විශේෂඥයින් සහ වෙනත් පුද්ගලයින්, ඔවුන්ගේ කාර්යයන් ක්‍රියාත්මක කරන අතරතුර දී සහ ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් කැඳවන ලද රැස්වීම් ස්ථානයට සහ ඉන් පිටතට ගමන් කරන අතරතුර දී, ශ්‍රී ලංකාවේ නීති සහ රෙගුලාසිවලට යටත්ව, පහත සඳහන් වරප්‍රසාද සහ මුක්තිය භුක්ති විඳිය යුතුයඃ

(අ) ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් එම මුක්තිය අත්හරින ලද අවස්ථාවක දී හැර, ඔවුන්ගේ නිල ධාරිතාවයෙන් ඔවුන් විසින් සිදු කරන ලද ක්‍රියාවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාවලියෙන් නිදහස් විය යුතුය.

(ආ) ඔවුන් දේශීය පුරවැසියන් හෝ ජාතිකයන් නොවන විට දී, ආගමන අවශ්‍යතා, විදේශික ලියාපදිංචි වීමේ අවශ්‍යතා සහ ජාතික සේවා වගකීම් සහ ශ්‍රී ලංකාව විසින් අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල සංසන්දනාත්මක ශ්‍රේණිවල පුද්ගලයන්ට ප්‍රදානය කර ඇති පරිදි හුවමාරු රෙගුලාසි සම්බන්ධයෙන් සමාන පහසුකම් ලබා දිය යුතුය; සහ

(ඇ) අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල සැසඳිය හැකි තරාතිරම්වල පුද්ගලයින්ට ශ්‍රී ලංකාව විසින් ලබා දී ඇති පරිදි සංචාරක පහසුකම් සම්බන්ධයෙන් එම සැලකීම ලබා දිය යුතුය.

(2) රජය විසින් ගෝලීය හරිත වර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ අනෙකුත් නිලධාරීන්ට අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල සංසන්දනාත්මක තරාතිරම්වල සාමාජිකයින්ට ලබා දී ඇති වරප්‍රසාද සහ මුක්තිය, නිදහස් කිරීම් සහ පහසුකම් ලබා දිය යුතුය. ඔවුන්ගේ සහකරු හෝ සහකාරිය සහ බාල වයස්කාර දරුවන් සම්බන්ධයෙන් ද එයම ලබා දෙනු ලැබේ. මේ සඳහා, ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් මෙම වගන්තියේ ඡේද අදාළ වන පුද්ගලයින්ගේ නම් රජයට නිතිපතා දැනුම් දිය යුතුය.

(3) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ට මෙම වගන්තියේ අඩංගු වරප්‍රසාද සහ මුක්තිය අදාළ නොවේ.

(4) ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් මෙම වගන්තියේ සඳහන් වරප්‍රසාද, මුක්තීන් සහ පහසුකම් සම්බන්ධයෙන් යුක්තිය නිසි ලෙස පරිපාලනය කිරීමට පහසුකම් සැලසීමට සහ කිසියම් අපයෝජනයක් සිදුවීම වැළැක්වීම සඳහා රජයේ සුදුසු බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

(5) ඉහත පුද්ගලයන් විසින් සිදු කරන ලද රථවාහන වැරදි සම්බන්ධයෙන් හෝ ඔවුන්ට අයත් හෝ ඔවුන් විසින් ධාවනය කරන ලද මෝටර් රථයක් නිසා සිදුවන හානියකදී නීතිමය ක්‍රියාවලියෙන් ලැබෙන මුක්තිය අදාළ නොවේ.

9 වැනි වගන්තිය

කාර්යාල පරිශ්‍රය

(3) මෙම ගිවිසුමේ වෙනත් ආකාරයකින් සපයා ඇති පරිදි හැර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති කාර්යාලය තුළදී ක්‍රියාත්මක විය යුතු වන අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධිකරණයට කාර්යාලය තුළ සිදු කරන ක්‍රියා සම්බන්ධයෙන් අධිකරණමය බලය ඇත.

(4) කාර්යාල පරිශ්‍රය උල්ලංඝනය කළ නොහැකි විය යුතු අතර, එය ගෝලීය හරිත වර්ධන ආයතනයේ පාලනය සහ අධිකාරිය යටතේ පැවතිය යුතුය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කිසිදු බලධාරියෙකු ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් එකඟ වූ කොන්දේසි යටතේ එකඟතාවයකින් තොරව කිසිදු රාජකාරියක් ඉටු කිරීම සඳහා කාර්යාල පරිශ්‍රයට ඇතුළු නොවිය යුතුය. ගිනි වැළැක්වීම, සනීපාරක්ෂක රෙගුලාසි හෝ හදිසි අවස්ථා සම්බන්ධයෙන් ගෝලීය හරිත වර්ධන ආයතනයේ පූර්ව අවසරයකින් තොරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලධාරීන් විසින් කාර්යාල පරිශ්‍රයට ඇතුළු විය හැක්කේ කුමන තත්ත්වයන් යටතේ සහ කුමන ආකාරයෙන්ද යන්න පිළිබඳව ගෝලීය හරිත වර්ධන ආයතනය සහ රජය එකඟ විය යුතුය.

(5) ගෝලීය හරිත වර්ධන ආයතනයට, ශ්‍රී ලංකා රජයේ අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම මත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ සහ ඉන් පිටත සිට කාර්යාලය සමඟ සන්නිවේදනය සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය වන එක් ස්ථානයකින් තවත් ස්ථානයකට විදුලි සංදේශ පහසුකම් සහ අනෙකුත් සන්නිවේදන සහ සම්ප්‍රේෂණ පහසුකම් ස්ථාපනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අයිතිය ඇත.

(6) ගෝලීය හරිත වර්ධන ආයතනය හට එහි මෙහෙයුම් සහ එහි කාර්යයන් ඉටු කිරීම සහ පූර්ණ ලෙස සහ ස්වාධීනව ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යාල පරිශ්‍රය තුළ නීති රීති නිර්මාණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බලය ඇත. ගෝලීය හරිත වර්ධන ආයතනය එවැනි නීති රීති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති අතර ගැටුමක් ඇති වුවහොත්, රජයේ නීති, රීති සහ රෙගුලාසි බලපැවැත්විය යුතුය.

(7) ශ්‍රී ලංකාවේ නීති සහ රෙගුලාසිවලට යටත්ව, කාර්යාල පරිශ්‍රය තුළදී රැස්වීම් කැඳවීමට ගෝලීය හරිත වර්ධන ආයතනය හට අයිතිය ඇත.

(8) කාර්යාල පරිශ්‍රය ගෝලීය හරිත වර්ධන ආයතනයේ අරමුණු සහ කාර්යයන් සමඟ ගැළපෙන ආකාරයට භාවිත කළ යුතුය. ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් කාර්යාල පරිශ්‍රය යුක්තියෙන් පලා යන්නන්ට හෝ පිටුවහල් කිරීමට යටත් වන පුද්ගලයින්ට හෝ නීතිමය ක්‍රියාවලියකින් හෝ අධිකරණ ක්‍රියාවලියකින් වැළකී සිටින පුද්ගලයින්ට රැකවරණයක් වීම වැළැක්විය යුතුය.

(9) ගෝලීය හරිත වර්ධන ආයතනය සාධාරණ යුක්තිය පසිඳලීමට පහසුකම් සැලසීම, පොලිස් රෙගුලාසි පිළිපැදීම සුරක්ෂිත කිරීම සහ මෙම ගිවිසුමේ සඳහන් මුක්තිය සහ පහසුකම් සහ වරප්‍රසාද සම්බන්ධයෙන් යම් අපයෝජනයක් සිදුවීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුසු බලධාරීන් සමඟ සෑම විටම සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

10 වැනි වගන්තිය

ගමනාගමනය සහ පදිංචිය

(1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ඇතුළුවීමට, ඉන් පිටවීමට සහ නිදහසේ ගමන් කිරීමට සහ කාර්යාලයට අනුයුක්ත පුද්ගලයන් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ නීති සහ රෙගුලාසිවලට යටත්ව ජාතිකත්වය නොසලකා සීමාකිරීම්වලින් තොරව පහත සඳහන් පුද්ගලයින්ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පදිංචියට පහසුකම් සැලසීම සඳහා රජය විසින් අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගත යුතුය ඃ

(අ) සම්මේලනය, කවුන්සිලය සහ උපදේශක කමිටුව සමන්විත වන ගෝලීය හරිත වර්ධන ආයතනයේ සාමාජිකයින්ගේ නියෝජිතයින් සහ අනෙකුත් පුද්ගලයින් ඔවුන්ගේ කාර්යයන් ඉටු කරන අතරතුරදී සහ ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් කැඳවන ලද රැස්වීම් ස්ථානයට සහ ඉන් පිටතට ගමන් කරන විට;

(ආ) ගෝලීය හරිත වර්ධන ආයතනයේ නිලධාරීන්;

(ඇ) විශේෂඥයන්;

(ඈ) කාර්යාලයට අනුයුක්ත කර ඇති ගෝලීය හරිත වර්ධන ආයතනයේ නිලධාරීන්ගේ සහ විශේෂඥයින්ගේ කලත්‍රයා සහ යැපෙන දරුවන් සහ ගෘහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්; සහ

(ඉ) නිල කටයුතු සඳහා ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් ආරාධනා කරන ලද වෙනත් පුද්ගලයින්. එම නිලධාරීන් පැමිණීමට පෙර, ගෝලීය හරිත වර්ධන ආයතනය විසින් එවැනි පුද්ගලයන්ගේ නම් රජයට දැනුම් දිය යුතුය.

## 11 වැනි වගන්තිය

## වරප්‍රසාද සහ මුක්තිය අත්හැරීම

(1) මෙම ගිවිසුම මගින් පුද්ගලයන්ට ලබා දී ඇති වරප්‍රසාද සහ මුක්තිය ප්‍රදානය කරනු ලබන්නේ ගෝලීය හරිත වර්ධන ආයතනයේ අවශ්‍යතා සඳහා මිස පුද්ගලයන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා නොවේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති සහ රෙගුලාසි අනෙකුත් සෑම අතින්ම පිළිපැදීම එවැනි වරප්‍රසාද සහ මුක්තිය භුක්ති විඳින සියලු පුද්ගලයන්ගේ යුතුකමකි. යම් විශේෂ අවස්ථාවකදී ඔවුන්ගේ මතය අනුව, යුක්තිය ඉටුවීම සඳහා මුක්තිය බාධාවක් වන්නේ නම්, ගෝලීය හරිත වර්ධන ආයතනය හි අවශ්‍යතාවලට අගතියකින් තොරව පහත සඳහන් පුද්ගලයන්ගේ මුක්තිය ඉවත් කිරීමට පහත සඳහන් බලධාරීන්ට අයිතියක් සහ යුතුකමක් ඇත.

(අ) සම්මේලනයේ සහ කවුන්සිලයේ ඔවුන්ගේ නියෝජිතයන් සම්බන්ධයෙන් ගෝලීය හරිත වර්ධන ආයතනයේ සාමාජිකයින් විසින්;

(ආ) ගෝලීය හරිත වර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සම්බන්ධයෙන් කවුන්සිලය විසින්;

(ඇ) කවුන්සිලයේ හෝ උපදේශක කමිටුවේ සාමාජිකයන් ලෙස සේවය කරන විශේෂඥයින් හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් සම්බන්ධයෙන් කවුන්සිලය විසින්; සහ

(ඈ) ගෝලීය හරිත වර්ධන ආයතනයේ නිලධාරීන් (තමා හැර), විශේෂඥයින් සහ ගෝලීය හරිත වර්ධන ආයතනයම සම්බන්ධයෙන් ගෝලීය හරිත වර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින්.

(2) අත්හැරීමක් සෑම අවස්ථාවකදීම විශේෂයෙන් ලිඛිතව ම කළ යුතුය.

EOG 09- 0073/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.